www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීනය සහ රුසියාව සමීප මිලිටරි සහයෝගිතාවයක් ගොඩ නගා ගනියි

## China and Russia forge closer military cooperation

**ජෝන් චැන් විසිනි**
**2009 මැයි 26**

ඇෆ්ගනිස්ථානයේ ඇමරිකානු යුද්ධය සහ පකිස්ථානයේ එක්සත් ජනපද පිටුබලය ලත් ගැටුම් උග්‍රවෙත්ම මෙම වසරේ යුද අභ්‍යාස 25 ක් නිවේදනය කරමින්, චීනය සහ රුසියාව මිලිටරි හවුල්කාරීත්වය වැඩි දියුනු කර ගනිමින් සිටිති. ඊට පෙර, 2002 සිට චීනය විදේශ රටවල් සමග හමුදා අභ්‍යාස 21 පවත්වා තිබුනි.

අප්‍රේල් 29 වෙනි දින පැවති ආරක්ෂක ලේකම්වරුන්ගේ කවුන්සිලය වන ෂැංහයි සහකාර සමාගම් (එස්සීඕ) රැස්වීමේ දී සැලසුම් සම්මත කර ගත්තේ ය. මන්ඩලය මිලිටරි සන්ධානයක් වීය යන්න ප්‍රතික්ෂේප කරමින් දේශපාලන ප්‍රතික්ෂේප කිරීමක් රැස්වීම විසින් නිකුත් කරන ලදී. සියලුම අභ්‍යාසයන් තුන්වැනි රටකට එරෙහිව නොව, "ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධය" මත කේන්ද්‍රගත කල බව එය ප්‍රකාශ කලේ ය.

කෙසේ වෙතත්, චීනය සහ රුසියාව අතර මිලිටරි බැඳීම් එක්සත් ජනපදයට අභියෝග කිරීමේ එල්ලයෙන් යුතුව කෙරුනක් බව නිසැකය. "නව ආරම්භක ලක්ෂ්‍යයකින් අනාගතය කරා යහපත් සහ වේගවත් සංවර්ධනයකට, දෙරටේ මිලිටරි බලයන් අතර සබඳතාවකට මෙන්ම චීන - රුසියානු මූලෝපායික හවුල්කාරීත්වය ඉහල නැංවීමට මම බලාපොරොත්තු වෙමි......"යි. සමීප මිලිටරි හවුල්කාරීත්වය සඳහා කැඳවුම් කරමින්, චීන ජනපති හු ජින්ටාඕ පසුගිය දෙසැම්බර් මාසයේ කියා සිටියේ ය.

2001 වසරේ එස්සීඕව පිහිටුවනු ලැබුවේ, චීනය සහ රුසියාව යන දෙරට ම මූලෝපායිකව වැදගත් වශයෙන් සලකන බලශක්ති සම්පත් බහුල මධ්‍යම ආසියාවේ පැරනි සෝවියට් සමූහාන්ඩු සමඟ වැඩෙන ඇමරිකානු සබඳතාවලට ප්‍රතිචාරයක් වශයෙනි. ඇමරිකාව විසින් ඇෆ්ගනිස්ථානය ආක්‍රමනය කිරීමත් සමග සංවිධානය පරිමාවෙන් විශාල කලේ ය. 2007 වසරේදී පලල් එස්සීඕ අංගයක් බවට විස්තාරනය වූ, සිය ප්‍රථම ඒකාබද්ධ මිලිටරි අභ්‍යාසය චීනය සහ රුසියාව විසින් පවත්වන ලද්දේ 2005 වසරේදී ය. රුසියාව, චීනය, කසකස්ථානය, උස්බෙකිස්ථානය, ටජිකිස්ථානය සහ කිර්ගිස්ථානය එස්සීඕ වට අයිති රටවල් වේ. ඉන්දියාව, පකිස්ථානය, මොන්ගෝලියාව සහ ඉරානය නිරීක්ෂන මට්ටමින් සහභාගී වෙති.

මෙම වසරේ යුද අභ්‍යාස දැනටමත් ඇරඹී තිබේ. අප්‍රේල් මාසයේ දී, එස්සීඕ විසින් ඇෆ්ගනිස්ථානයට මායිම්වන කිර්ගිස්ථානයේ දී ඒකාබද්ධ ත්‍රස්ත විරෝධී අභ්‍යාසයක් පැවැත්වීය. ජූලි සහ අගෝස්තුවල පැවැත්වීමට සැලසුම් කරන ලද ප්‍රධානතම අභ්‍යාසය "සාම මෙහෙවර 2009" - රුසියන් සහ චීන හමුදා භට පිරිස් 2000 කට වැඩි පිරිසක් සම්බන්ධ කරගත් සහ යුද ටැංකි, ප්‍රවාහන ගුවන් යානා, ස්වයංක්‍රීය කාලතුවක්කු සහ ඇතැම්විට මූලෝපායාත්මක බෝම්බ කරුවන්ගෙන් සමන්විත සාම්ප්‍රදායික පුහුනු අභ්‍යාසයකට සමාන වෙනු ඇත. රුසියාවේ සැලසුම් කරනු ලැබූ, අවධි තුනේ අභ්‍යාසය මොන්ගෝලියාවට මායිම් වන ඊසානදිග චීනයේ දී පැවැත්වීමට නියමිත ය.

නේටෝව සමග රුසියන් සබඳතා ජෝර්ජියාව සම්බන්ධයෙන් ක්‍රමයෙන් පිරිහෙන විට චීන- රුසියන් සමීප සබඳතාවන් පිලිබඳ නිවේදනය පැමිනියේ ය. ජොර්ජියාව තුල දින 27 ක නේටෝ මිලිටරි අභ්‍යාසයන් පිලිබඳ රුසියාව චෝදනා කරමින් සිටින අතරේ, අප්‍රේල් මාසයේ ජෝර්ජියානු යුද ටැංකි සේනාංකයක කැරලි ගැසීම පිටුපස රුසියාව සිටින බවට ටිබිලිසි, චෝදනා නැගී ය.

අප්‍රේල් 28 වෙනි දින, චීන ආරක්ෂක අමාත්‍ය ලියන්ග් ග්වාන්ග්ලිගේ නායකත්වයෙන් යුතු දූත කන්ඩායමක්, රුසියන් ජනාධිපති ඩිමිත්‍රී මෙඩ්වෙඩෙව් සමග කලාපීය ආරක්ෂාව පිලිබඳ සාකච්ඡා කිරීමට, රුසියාවේ උතුරු කොකේසස් දිස්ත්‍රිකයට පැමිනියේ ය. අප්‍රේල් 30 වෙනි දින ජෝර්ජියාවෙන් කැඩුන අබ්කාසියා සහ දකුනු ඔසෙටියා කලාප දෙක, රුසියානු හමුදාවන්ට තමන්ගේ දේශ සීමා මුර කිරීමට අවසර ලබා දෙන පස්වාර්ෂික ආරක්ෂක ගිවිසුම්වලට රුසියාව සමග අත්සන් තැබුවෝ ය.

සමීප රුසියන්- චීන සබඳතා පිටුපස පවතින සැබෑ ගාමක බලය වන්නේ, බලශක්ති සම්පත් බහුල ප්‍රධාන යුරේසියානු භූමිය තමන්ගේ අත යටට ගැනීමට කැසකවන ඇමරිකන් මූලෝපායික සැලසුම් පිලිබඳ

ඔවුන්ගේ අන්‍යෝන්‍ය සැලකිල්ලයි. ඔබාමා පාලන තන්ත්‍රය රුසියාව, චීනය සහ ඉරානය කෙරෙහි මිත්‍රශීලී මවාපෑමක් කරනු ලැබුව ද, ඇෆ්ගනිස්ථානයේ සහ මේ වන විට පකිස්ථානය තුල යුද්ධය උග්‍ර කර තිබේ. මෙම ධාවකයන්, ඉරාකය තුල බුෂ් පාලන තන්ත්‍රය විසින් ගෙන ගිය විනාශයටත් වඩා අතිශය බිකරු බව බිජිං සහ මොස්කව් විසින් සලකනු ලබයි.

ඒෂියන් ටයිම්ස් මැයි 14 මෙසේ පින්තාරු කලේ යඃ "ඇෆ්ගනිස්ථානය පිලිබඳ කල්පනා කිරීමේදී දැන් සිදුවන තෙල් (ඛනිජතෙල් සහ ගෑස්) යුද්ධයේ දී නොතකා හරින ලද බිම් කඩක් වශයෙන් සලකනු ලැබේ. සියල්ලටමත් පසුව, 1970 ගනන්වල මුල් භාගයේ රිචඩ් නික්සන්ගේ යුගයේ පටන් ඇමරිකානු විදේශ ප්‍රතිපත්තියේ වඩා දුරයන්නා වු අරමුන වශයෙන් පැවතියේ චීනය සහ රුසියාව භේද කිරීමයි. 1999 මාර්තු සර්බියාවට බෝම්බ දැමීම ඇරඹීමට දින පහකට පෙරතුව එක්සත් ජනපද කොන්ග්‍රසය විසින් සේද මාවතේ මූලෝපාය පනත සම්මත කර ගත් තැන් පටන්, එස්සීඕ නායකත්වය මේ කෙරේ තම අවධානය යොමු කලේය. යුරේසියානු බලශක්ති අංගනයක් මිලිටරිකරනය කිරීම සහ මධ්‍යම ආසියාවේ ඇමරිකානු රැකවරනිත රාජ්‍යයන් පොකුරක් ගොඩ නැගීම කලු මුහුදේ සිට බටහිර චීනය දක්වා ඇමරිකන් ගෝලීය මූලෝපායික අවශ්‍යතා ලෙස පනත විසින් පැහැදිලිව ම හඳුනා ගෙන ඇත. ඇෆ්ගනිස්ථානය, එය පිහිටා ඇති අයුරින්, බටහිර චීනයට කොකේසියාව සම්බන්ධ කරමින් සෑම සේද මාවතක ම මංසන්ධියේ පිහිටා ඇති අතර, චීනය, රුසියාව, පකිස්ථානය සහ ඉන්දියාව ප්‍රත්‍යන්ත ප්‍රදේශය රැකවල් ලා සිටී.

වඩ වඩාත් වේගයෙන් මධ්‍යම ආසියාව ප්‍රධාන බලයන් අතර පොරපිටියක් බවට පත්වෙමින් තිබේ. මොස්කව් සහ බීජිංවල පීඩනය යටතේ, මධ්‍යම ආසියාවෙන් ඇමරිකන් හමුදා කඳවුරු ඉවත් කර ගන්නා ලෙස, 2005 වසරේ දී එස්සීඕ විසින් බලකර සිටියේ ය. උස්බෙකිස්ථානය ඇමරිකන් ගුවන් කඳවුර වසා දැමූ අතර, ඇෆ්ගනිස්ථානයට අවි සම්පාදනය කිරීම සඳහා එක්සත් ජනපදය විසින් යොදාගත් මනා කඳවුර වසා දමන බව මේ වසරේ මුල දී, කිර්ගිස්ථානය නිවේදනය කලේ ය. දෙවනි නිවේදනය, ආධාර වශයෙන් ඩොලර් බිලියන 2.15 ක රුසියන් සන්තෝෂමක් සමග සමපාත විය.

පාකිස්ථානයේ මායිම් ප්‍රදේශ ඉතා ඉක්මනින් යුද්ධයට පැටලීමත් සමග භූමියෙන් අවහිර වු ඇෆ්ගනිස්ථානය කරා විකල්ප සැපයුම් මාවත් සඳහා පෙන්ටගනය විමර්ශනය කරමින් සිටී. ඉරානය සමග සම්බන්ධතාවයක් නැති හෙයින් එකම විකල්පය මධ්‍යම ආසියාව හරහා මාවතක් යොදා ගැනීම ය. මෙම වසරේ දී එක්සත් ජනපදය සීමිත මිලිටරි භාන්ඩ ප්‍රවාහනය සඳහා අවසර ලබා ගැනීමට, ඇෆ්ගනිස්ථානයට මායිම්වන එස්සීඕ රටවල් දෙකක් වන ටජික්ස්ථානය හා උස්බෙකිස්ථානය සමග ගිවිසුම් අත්සන් කලේ ය.

කෙසේ වෙතත්, මධ්‍යම ආසියාව කරා දිවෙන ප්‍රධාන මාවත් යොදාගැනීමේ දී ජෝර්ජියාව සහ යුක්රේනය නේටෝව ට ඇතුලත් කර ගැනීමේ සැලසුම හකුලා ගැනීම වැනි සැලකිය යුතු සහන එකඟතාවෙන් ඉල්ලා සිටින රුසියාවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍යය. පෙන්ටගනය, රුසියාව මඟහරිමින් කලු මුහුදේ සිට ජෝර්ජියාව සහ අසර්බයිජනය හරහා ටර්මෙකිස්ථානයට නව සැපයුම් මාවතක් වර්ධනය කර ගැනීමට උත්සහා දරමින් සිටී.

රුසියාව, ආධාර හා මිලිටරි සහයෝගීත්වය සමගින් මධ්‍යම ආසියාවේ තමන්ගේ බලපෑම වර්ධනය කර ගෙන ඇත. පෙබරවාරි මාසයේ දී ඒකාබද්ධ ආරක්ෂක ගිවිසුම් සංවිධානය (සීඑස්ටීඕ) හි කොටසක් වශයෙන් රුසියාව, බෙලෝරුසියාව, කිර්ගිස්ථාන්, ටජිකිස්ථාන්, උස්බෙකිස්ථානනය සහ කසකස්ථානය යන පැරනි සෝවියට් සමූහාන්ඩුවට ඇතුලත් කරගත් භටයන් 3,000කින් සමන්විත ක්ෂනික විහිදුම් බලකායක් මොස්කෝව විසින් ස්ථාපිත කලේ ය. සැලැස්ම භටයන් 10,000 දක්වා ඉහල දැමීමට නියමිතව ඇත.

එස්සීඕ වේ සෑම මධ්‍යම ආසියාතික රටක්ම දැඩි ලෙස මොස්කව් බලපෑමට යටත්ව නැත. උදාහරනයක් ලෙස උස්බෙකිස්ථානය අප්‍රේල් මස ටජික් - අෆ්ගන් දේශසීමාවේ පැවති එස්සීඕ "ත්‍රස්ත විරෝධී" අභ්‍යාසයට සහභාගීවීම ප්‍රතික්ෂේප කලේ ය. සිය දේශපාලනික විරුද්ධත්වය මත ප්‍රහාර එල්ල කිරීම පිලිබඳ බටහිර විවේචනවලින් අනතුරුව සීග්‍රයෙන් මොස්කව් කරා හැරුනු 2005 වසර තෙක්ම උස්බෙකිස්ථානය මධ්‍යම ආසියාවේ වැදගත්ම එක්සත් ජනපද හවුල්කරුවෙක්ව සිටියේ ය.

රුසියාවේ උපදෙස් ලබා ගැනීමකින් තොරව ඇෆ්ගනිස්ථානය වෙත සැපයුම් මාවතක් විවර කර ගැනීමේ ශක්‍යතාව පිලිබඳ සාකච්ඡා කිරීමට උස්බෙකිස්ථානය විසින් ආරක්ෂක සාමාජිකයන් පිරිසක් ජර්මනියට යවන ලදුව, පසුගිය ඔක්තෝබරයේ දී යුරෝපියානු සංගමය උස්බෙකිස්ථානයට තම සම්බාධක ලිහිල් කලේ ය. නොවැම්බර්යේදී රුසියාව, කසකස්ථානය සහ බෙලාරුස් යන රටවල් විසින් තීරු බදු සංගමයක් පිහිටුවීමේ සැලසුම් වලට එරෙහි වෙමින් යුරේසියානු ආර්ථික ප්‍රජාවෙන් උස්බෙකිස්ථානය ඉවත් කලේ ය.

එක්සත් ජනපද මූලෝපායේ ප්‍රධාන ඉලක්කයක් වන්නේ ගෑස් නිෂ්පාදනය කරන ටර්ක්මෙනිස්ථානයයි. සෝවියට් යුගයේ භූමි වල ගෑස් නැති වී යත්ම රුසියාව ගෑස් සම්පාදනය කර ගැනීමට මධ්‍යම ආසියාව කෙරේ අවධානය යොමු කිරීමට පටන් ගත්තේ ය. කෙසේ වෙතත් පසුගිය වසරේ රුසියාව

විසින් ටර්ක්මෙනිස්ථානයට ගෙවීමට පොරොන්දු වූ ඉහල මිල ගෙවීමට මොස්කෝවට හැකි වූයේ නැත. රුසියාව මඟහැර යුරෝපයට කෙලින්ම අපනයනය කිරීමට විකල්ප නල මාර්ග යොදා ගැනීමට ටර්ක්මෙනිස්ථාන් නායකත්වය එකඟ කරවා ගැනීමට වොෂින්ටනය මං සොයමින් සිටී. ඇෆ්ගනිස්තානය හරහා ටර්ක්මෙනිස්තානයේ සිට පකිස්තානය හා ඉන්දියාවට ගෑස් නල සම්බන්ධ කිරීමට ද එක්සත් ජනපදය සහයෝගය දෙයි.

රුසියන් සහ මධ්‍යම ආසියනු බලශක්ති සැපයුම් මාර්ග යොදා ගැනීමට දැඩි විරුද්ධත්වයක් දක්වන චීනයේ අභියෝගයන්ට ද ඇමරිකා එක්සත් ජනපදය මුහුන පා සිටී. පෙබරවාරියේ දී, බීජිං රුසියාව සමග ඩොලර් බිලියන 25 ක් සහ කසකස්ථානය සමග ඩො.බි 10 ක් වන තෙල් ගිවිසුම් දෙකකට අත්සන් තැබුවේ ය. ටර්ක්මෙනිස්ථානයේ දී දකුනු චීනයට ගෑස් ප්‍රවාහනය කරවා ගැනීමට , බීජිං, ලෝකයේ දිගම (කි.මී 7,000ක් දිග) සහ වියදම් වැඩිම (ඩො.බි. 26ක්) නලමාර්ගයක් ගොඩ නඟමින් සිටී. ගිවිසුම් අත්සන් කරන මොහෙතේ දී තමන්ගේ අවශ්‍යතාවන්ට "තුන්වැනි පාර්ශවයක්" වෙතින් තර්ජනය නොවනු ඇතැයි බීජිං සඳහන් කලේ ය. පැහැදිලිව ඉන් අදහස් කෙරුනේ බාධකයන් ලෙස පවතින ඇමරිකානු කඳවුරුය.

ඇෆ්ගනිස්ථානයේ සහ පාකිස්ථානයේ ඇමරිකන් යුද්ධවලට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් රුසියන් - චීන මිලිටරි සහයෝගය ශක්තිමත් කිරීම, මධ්‍යම ආසියාවේ ප්‍රමුඛ මූලෝපායික කලාපය පිලිබඳ පලල් ගැටුමක ශක්‍යතාව පිලිබඳ තවත් ඇඟවුමකි.

© www.wsws.org